(7)

# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## පුරප්පාඩු

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01 අභ්‍යන්තර විගණන නිලධාරි (JM 1-1) - තනතුරු 01

- බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හෝ 2)

1. කළමනාකරණය හෝ වාණිජ යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

2. එම විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හෝ 2 හෝ 3)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-1) සේවා ශ්‍රේණියෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක ( 05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. කළමනාකරණ සහකාර - තාක්ෂණික (MA 2-1) සේවා ශ්‍රේණියෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- වයස : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

- වැටුප් පරිමාණය : රු.42,600/= - 755 x 10, - 1,135 x 18 - රු.70,580/=

### 02 වැවිලි සහකාර (MA 2-1) - තනතුරු 18

- බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :-

1. රජයේ අනුමත කෘෂිකර්ම විද්‍යාලයකින් / ආයතනයකින් ලබාගත් අවුරුදු දෙකක (02) ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :-

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

- වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

- වැටුප් පරිමාණය : රු.30,310/= - 300 x 10, - 350 x 7, - 495 x 4, - 660 x 20 - රු.50,940/=

## 03 ක්ෂේත්‍ර සහකාර (MA 1-1) - කනතුරු 12

- බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හා 2)

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

   i සිංහල/ දෙමළ
   ii. ගණිතය

   යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :-

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත"ආ" "ඇ" සහ "ඉ" හි සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

   i. සිංහල/ දෙමළ
   ii. ගණිතය

   යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකින් විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටතේ පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

සටහන් :- (I) යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත"ආ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත "ආ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

- වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

- වැටුප් පරිමාණය : රු.27,910/= - 300 x 10, - 350 x 7,- 495 x 4, - 660 x 20 - රු.48,540/=

4. මුරකරු (PL - 1) - තනතුරු 05

- බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :-

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම.

   - වයස : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

   - වැටුප් පරිමාණය : රු.24,750/= - 250 x 10, - 270 x 10,- 300 x 7, - 330 x 15 - රු.37,000/=

❖ **ඉහතින් සඳහන් කර ඇති සුදුසුකම්වලට අමතරව සෑම තනතුරක් සඳහාම ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක් ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

උක්ත තනතුරු සඳහා ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත් සහතිකවල පිටපත්ද සහිතව පහත සඳහන් ලිපිනයට **2024.02.20** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් එවිය යුතුය. ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා කජු සංස්ථාව,
නො.1334, පරණ කෝට්ටේ පාර,
රාජගිරිය.